# සාමාන්‍ය සමයේ විසිදෙවන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන දේව ප්‍රකාශනය

ශුද්ධවූ පාවුලු තුමන් විසින් කොලොස්සිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

කොලොස්සි 1: 9-14

"පියාණන් වහන්සේ අන්ධකාරයේ බලයෙන් අප මුදා තම ප්‍රේමාන්විත පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප කැඳවූ සේක."

මේ කරුණ නිසා, අපි එය ඇසූ දා පටන් ඔබ ගැන නොකඩවා යාච්ඤා කළෙමු. සියලු ආකාර ප්‍රඥාව ද ලොව්තුරා ඥානය ද ලබා, ඔබ දෙවියන් වහන්සේගේ කැමැත්ත සම්පූර්ණ ලෙස අවබෝධ කරගෙන, ස්වාමින් වහන්සේට ඔබින ලෙසත්, ප්‍රිය මනාප වන ලෙසත් හැසිරෙන මෙන් යාච්ඤා කරමු. සියලු ආකාර යහපත් ක්‍රියාවලින් පලදායී වන මෙන් ද දෙවියන් වහන්සේ ගැන දැනගැන්මෙහි වැඩි වර්ධනය වන මෙන් ද යාච්ඤා කරමු. ධෛර්යයෙන් ද ඉවසිල්ලෙන් ද ප්‍රීතියෙන් ද සියල්ල දරා ගැනීමට දෙවියන් වහන්සේ ස්වකීය මහිමාන්විත බලපරාක්‍රමය අනුව සියලු ආකාර බලයෙන් ඔබ ශක්තිමත් කරන සේක්වා! ආලෝකයේ වසන සැදැහැවතුන්ගේ උරුමයට පංගුකාරයන් වීමට ඔබ සුදුස්සන් කළ පියාණන් වහන්සේට ස්තුති කරන්න. අන්ධකාරයේ බලයෙන් අප මුදා, තම ප්‍රේමාන්විත පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප පැමිණෙව්වේ උන් වහන්සේ ය. උන් වහන්සේ විමුක්තිය ද පව් කමාව ද අපට ප්‍රදානය කළ සේක.

දේව වචනය මෙසේ ය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 98: 2-6

පිළිතුර: සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ සේක.

ගීය:

සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ සේක.
විජාතීන්ගේ ඇස් හමුයෙහි සිය විමුක්ති බලය එළිදරවු කළ සේක.
එතුමාණෝ ඉශ්රායෙල් වංශය කෙරෙහි එතුමන්ගේ ප්‍රේමයත්, විශ්වාසවන්තකමත් සිහි කළ සේක.

මිහිපිට සියලු දෙන අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝ ය.
එම්බා ලෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ප්‍රීතියෙන් ගී ගයන්න.
ප්‍රීති ගී ගයමින් එතුමන් පසසන්න.

වීණාව වයමින් සමිඳුන්ට ගී ගයන්න. වීණාවෙන් ද ගී නාදයෙන් ද ප්‍රශංසා කරන්න. හොරණෑ හා තළා හඬින් ද රජාණන් වන සමිඳුන් අබිමුව ප්‍රීතියෙන් ගී ගයන්න.

## සුසුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මහිමයට පංගුකාරයන් වන පිණිස සුබ අස්න මගින් දෙවියන් වහන්සේ අප කැඳවූ සේක.

ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"මා අනුව එන්න, මා ඔබ මිනිසුන් දිනාගන්නන් කරමි"යි සමිඳාණෝ වදාරන සේක.

ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ලූක් 5: 1–11

"ඔව්හු සියල්ල හැර දමා උන්වහන්සේ අනුව ගිය හ."

දිනක් ජේසුස් වහන්සේ ගෙන්නෙසෙරෙත් විල අසල සිටියදී, සමූහයා දෙවියන් වහන්සේගේ දහම් පණිවුඩය අසනු පිණිස උන්වහන්සේ වටා තෙරපී තෙරපී සිටි කල, විල අයිනේ ඔරු දෙකක් තිබෙනු උන්වහන්සේ දුටු සේක. ධීවරයෝ ඒවායින් බැස විත් දැල් සෝදමින් සිටියහ. උන්වහන්සේ ඒ ඔරුවලින් එකක් වූ සීමොන්ගේ ඔරුවට නැගී එය වෙරළින් මඳක් ඈතට දියත් කරන්නට කියා එහි වැඩ හිඳ සමූහයාට අනුශාසනා කළ සේක. එය නිමවූ කල උන්වහන්සේ සීමොන්ට කතා කොට, "මසුන් අල්ලන පිණිස දියඹට ගොස් දැල් හෙළන්නැ"යි වදාළ සේක. සීමොන් පිළිතුරු දෙමින්. "ස්වාමිනි, රෑ මුළුල්ලේ ම වෙහෙස වූ නමුත් අපි කිසිවක් නොලදිමු. එහෙත් ඔබ කියන සේක් නම් දැල් හෙළමි"යි කීය. එසේ කළ විට ඔව්හු මසුන් මහා රාශියක් අල්ලා ගත්හ. ඔවුන්ගේ දැල් ද ඉරෙන්නට වන. ඔව්හු ද ඔරුවේ උදව්වට එන ලෙස අනික් ඔරුවෙහි සිටි හවුල් කාරයන්ට සංඥා කළහ. ඔව්හු ද අවුත් ඔරු දෙක කිඳා බසින තරමට පුරවා ගත්හ. සීමොන් පේදුරු ඒ දැක, ජේසුස් වහන්සේගේ පාමුල දණින් වැටී, "ස්වාමිනි, මා වෙතින් ඉවත් වනු මැනව. මම පව්කාර මිනිසෙකැ"යි කීය. මන්ද ඔහු ද ඔහු සමඟ සිටි සියල්ලෝ ද තමන් ඇල්លූ මසුන් රාශිය දැක විස්මිත වූහ.

සීමොන්ගේ හවුල්කාරයන් වූ සෙබදීගේ පුත් ජාකොබ් ද, ජුවාම් ද එසේම විස්මිත වූහ. ජේසුස් වහන්සේ සීමොන්ට කතා කරමින්, "බිය නොවන්න. මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇතැ"යි වදාළ සේක. ඔව්හු තමන්ගේ ඔරු වෙරළට ඇද ඒ සියල්ල හැර දමා උන්වහන්සේ අනුව ගියහ.

සමිඳාණන් වහන්ගේ සුභාරංචිය මෙසේ ය.